පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව -
සති පාසල

සතිය- 12 (1 වාරය)

විෂය:- :- ගණිතය

ශ්‍රේණිය:- 8

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

(ඉගෙනුම් කාලය :- පැය 2 )

# 07. සාධක

## 7.3 වීජීය ප්‍රකාශනයක් එක් සාධකයක් සෘණ සංඛ්‍යාවක් වන පරිදි සාධකවල ගුණිතයක් ලෙස ලිවීම

- වීජීය ප්‍රකාශනයක එක් සාධකයක් සෘණ සංඛ්‍යාවක් වන අවස්ථාවේදී ඉතිරි සාධකයේ එක් එක් පදයේ ලකුණ මුල් වීජීය ප්‍රකාශනයේ අනුරූප පදයේ ලකුණට ප්‍රතිවිරුද්ධ වේ.

$-2x+6y$ යන වීජීය ප්‍රකාශනය සලකමු. මෙහි 2 යනු එක් පොදු සාධකයකි.
එම නිසා $-2x+6y = 2\ (-x+3y)$

$-2x = (-2)\times x$ සහ $6y = (-2)\times(-3)\times y$ බැවින්,
$(-2)$ ද $-2x$ හා $6y$ පදවල පොදු සාධකයකි.
එම නිසා, $-2x+6y = (-2)\times x + (-2)\times(-3)\ y$
$= (-2)\ (x+(-3)\ y)$
$= -2\ (x-3y)$

- 86 පිටුව අධ්‍යයනය කර 7.3 අභ්‍යාසය කරන්න.

## 7.4 වීජීය ප්‍රකාශනයක එක් සාධකයක් වීජීය පදයක් වන පරිදි සාධක දෙකක ගුණිතයක් ලෙස ලිවීම

$pq+pr$ වීජීය ප්‍රකාශනය සලකමු.
$pq = p\times q$
$pr = p\times r$
මෙම ප්‍රකාශනයේ එක් එක් පදයේ $p$ සාධකයක් වන බැවින්, $p$ මෙම පද දෙකේ පොදු සාධකයකි.

$\therefore pq+pr = p\times q + p\times r$
$= p\ (q+r)$

- පළමුව වීජීය ප්‍රකාශනයේ පදවල මහා පොදු සාධකය සොයන්න.
- ම.පො.සා. එක් සාධකයක් ලෙසද එම සාධකයෙන් වීජීය ප්‍රකාශනයේ එක් එක් පදය බෙදීමෙන් ලැබෙන ප්‍රකාශනය අනික් සාධකය ලෙසද ගන්න.
- වීජීය ප්‍රකාශනය, එම සාධක දෙකෙහි ගුණිතයක් ලෙස ලියන්න.
- 87,88 පිටු අධ්‍යයනය කර 7.4 අභ්‍යාසය කරන්න.